# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී (නීති) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2020 (විවෘත)

අංක 2194 දරන 2020 සැප්තැම්බර් මස 18 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද **''බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී (නීති) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2020 (විවෘත)''** විභාග නිවේදනයේ 02 වැනි ඡේදය සහ 05 වැනි ඡේදයේ සඳහන් වැටුප් පරිමාණය පහත පරිදි සංශෝධනය කෙරේ.

02. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2021.01.18 වැනි දින තෙක් දීර්ඝ කරනු ලැබේ. නමුත් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2020.10.19 වැනි දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. *වැටුප් පරිමාණය.-* රා. ප. ච. 03/2016 අනුව රු. 31,490/-10x445-11x660-10x730-5x750-රු. 54,250/-(MN4-2016)

(2) එම *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වෙනු ලැබේ.

(3) මේ වන විටත් මෙම විභාගය සඳහා අයදුම් කර ඇති නිලධාරීන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2020 දෙසැම්බර් මස 14 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628, 10 වන මහළ,
ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර,
රාජගිරිය.